සංඛ්‍යා පද්ධති - 8 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය , අම්පාර

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සංඛ්‍යාවක් පිහිටන ස්ථානය අනුව එම සංඛ්‍යාවට ලැබෙන වටිනාකම .... ලෙස හැඳින්වේ.

I. පාදය II. සංකේත III. ස්ථානීය අගය IV. සංඛ්‍යා පද්ධතිය

02. අප විසින් පරිගණකයට ආදානය කරනු ලබන දත්ත හා උපදෙස් පරිගණක මතකය තුළ තැන්පත් වන්නේ .... වශයෙනි.

I. ශබ්ද II. ද්වීමය බිටු අනුක්‍රම III. රූප IV. පාඨ

03. පරිගණකය තුළ සියලු දත්ත නිරූපණය කරන්නේ,

I. 0,0 වශයෙනි. II. 1,1 වශයෙනි. III. 0,1 වශයෙනි. IV. මේ කිසිවක් නොවේ.

04. 10010_{10} සංඛ්‍යාවේ පාදය .... වේ.

I. ද්වීමය II. අෂ්ටමය III. දශමය IV. ෂඩ් දශමය

05. පහත සංඛ්‍යා අතුරින් අෂ්ටමය සංඛ්‍යාවක් විය නොහැක්කේ,

I. 27 II. 136 III. 486 IV. 512

06. ෂඩ් දශමය සංඛ්‍යා පද්ධතියට අයත් පාද ගණන වන්නේ,

I. 2 II. 8 III. 10 IV. 16

07. 256_{10} සංඛ්‍යාව විහිදුවා ලිවීමේ දී 5 සංඛ්‍යාවෙන් නිරූපනය කරනු ලබන අගය වන්නේ,

I. 5 II. 50 III. 0.5 IV. 500

08. 678_{10} සංඛ්‍යාව විහිදුවා ලිවීමේ දී 6 යන සංඛ්‍යාවේ ස්ථානීය අගය වන්නේ,

I. 10^0 II. 10^1 III. 10^2 IV. 10^3

09. 25 යන දශමය සංඛ්‍යාවට අනුරූප ද්වීමය සංඛ්‍යාව වන්නේ,

I. 11010_2 II. 11101_2 III. 11001_2 IV. 10110_2

10. 11110101_2 ද්වීමය සංඛ්‍යාවට අනුරූප දශමය අගය වනුයේ,

I. 425 II. 255 III. 524 IV. 245

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. සංඛ්‍යා පද්ධතියක් යනු කුමක්ද?

02. පරිගණක භාවිතයේ දී යොදා ගන්නා සංඛ්‍යා පද්ධති වර්ග කීයද? ඒ මොනවාද?

03. පහත දැක්වෙන දශමය සංඛ්‍යා විහිදුවා ලියන්න.

I. 735_{10}

II. 856_{10}

III. 287_{10}

IV. 549_{10}

V. 698_{10}

04. පහත දැක්වෙන දශමය සංඛ්‍යා ද්වීමය සංඛ්‍යා බවට හරවන්න.

I. 48_{10}

II. 136_{10}

III. 538_{10}

IV. 273_{10}

V. 1027_{10}

05. පහත දැක්වෙන ද්වීමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට හරවන්න.

I. 101_{2}

II. 111010_{2}

III. 1010010_{2}

IV. 11110110_{2}

IV. 1000111_{2}

මෙහෙයුම් පද්ධතිය භාවිතයෙන් පරිගණකයක් වින්‍යාස කිරීම සහ සිටුවම් කිරීම. - 8 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී   පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➤ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිගණකයට සම්බන්ධ කර ඇති සියලු රැහැන් පරීක්ෂා කිරීම සිදු කළ යුත්තේ .... කිරීමෙන් පසුවය.

I. යතුරු පුවරුව සම්බන්ධ   II. Install   III. විදුලි සැපයුම විසන්ධි   IV. Restart

02. පරිගණකයේ මුදල් ඒකක සහ ඒවායේ ආකෘති සිටුවම් කිරීම සඳහා යොදා ගන්නා අයිතමය වන්නේ,

I. Date   II. Numbers   III. Curremcy   IV. Time

03. පරිගණකයක කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට නම් අනවශ්‍ය මෘදුකාංග .... කළ යුතුය.

I. Install   II. Restart   III. VGA   IV. Uninstall

04. USB කෙවෙනිය භාවිතා කර පරිගණකයට සම්බන්ධ කළ නොහැකි උපාංගයක් වන්නේ,

I. මුද්‍රකය   II. සංදර්ශකය   III. සුපරීක්ෂණය   IV. යතුරු පුවරුව

05. පරිගණකයට රූපවාහිනියක් සම්බන්ධ කිරීමට වඩාත් සුදුසු කෙවෙනිය වන්නේ,

I. DVI   II. USB   III. Esata   IV. HDMI

06. මෘදුකාංග දෝෂයක් නොවන්නේ,

I. ජාලය හා සම්බන්ධ නොවීම.   II. ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

III. විවෘත වුවද ප්‍රතිචාර දැක්වීම.   IV. පරිශීලක විධාන මත ක්‍රියාත්මක නොවීම.

07. යතුරු පුවරුව සහ මූසිකය පරිගණකයට සම්බන්ධ කිරීම සඳහා යොදා ගන්නා කෙවෙනිය,

I. VGA   II. PS2   III. DVI   IV. HDMI

08. පරිගණකයට RJ45 සම්බන්ධකය යොදා ගනු ලබන්නේ,

I. සංදර්ශකය සම්බන්ධ කිරීමට   II. පරිගණක ජාල ගත කිරීමට

III. බාහිර ආචයන උපාංග සවි කිරීමට   IV. මුද්‍රකය සම්බන්ධ කිරීම

09. පරිගණකය මන්දගාමී වීමේ දී යොදා ගත හැකි විසඳුමක් වන්නේ,

I. යෙදුම් මෘදුකාංග පිළිසකර කිරීම. II. ප්‍රති වෛරස් මෘදුකාංගයක් ස්ථාපිත කිරීම.

III. මෙහෙයුම් පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම. IV. මෘදුකාංගය බලපත්‍ර සහිත ද යන්න විමසීම.

10. Windows 10 මෙහෙයුම් පද්ධතියේ පරිගණක තිරය (Desktop) දර්ශනය කළ හැකි ආකාර,

I. 1 කි. II. 2 කි. III. 3 කි. IV. 4 කි.

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පරිගණක ගොනුවක් යනු කුමක්ද?

02. ගොනුවක තිබිය යුතු ගුණාංග 04 ක් නම් කරන්න.

03. හිස්තැන් පුරවන්න.



04. දෘඩාංග දෝෂ සඳහා උදාහරණ 03 ක් ලියන්න.

05. පහත දැක්වෙන කෙවෙනි නම් කරන්න.







වදන් සැකසීම - 8 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී   පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. වදන් සැකසුම් මෘදුකාංගයේ කාර්යයක් වන්නේ,

I. දත්ත අනුපිළිවෙලකින් දැක්වීම.   II. ලැයිස්තු සකස් කිරීම.

III. දත්ත ආකෘති පත්‍ර භාවිතය   IV. අවශ්‍ය දත්ත පමණක් වෙන් කර ගැනීම.

02. වදන් සැකසීමේ මෘදුකාංගයේ දී යොදා ගන්නා පොදු මෙවලමක් වන්නේ,

I. ලේඛනයක් තැන්පත් කිරීම.   II. අකුරු පාට කිරීම.

III. පසුබිම වර්ණ ගැන්වීම.   IV. අංකන භාවිතය

03. නව ලේඛනයක් සඳහා අලුතින් පිටුවක් ලබා ගන්නා නිවැරදිම ආකාරය වන්නේ,

I. File ⟶ New   II. File ⟶ Save

III. File ⟶ Print   IV. File ⟶ New   Blank Document

04. කලින් තැන්පත් කරන ලද ලේඛනයක් වෙනත් නමකින් තැන්පත් කිරීම සඳහා ……………… යොදා ගැනේ.

I. Save   II. Open   III. Save As   IV. New

05. අකුරු හැඩසව් කිරීමේ මෙවලමක් නොවන්නේ,

I.

II. 

III. 

IV. 

06. පහත A,B,C,D හි කාර්යය අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,



A   B   C   D

I. Copy, Redo, Undo, Cut   II. Redo, Undo, Cut, Copy

III. Cut, Redo, Copy, Undo   IV. Copy, Redo, Cut, Undo

07.  මෙවලමෙන් ලේඛනයට සිදු කරන කාර්යය වන්නේ,

I. පින්තූර (Picture) එකතු කිරීම.   II. හැඩතල (Shapes) එකතු කිරීම.

III. අකුරු කොටු (Text Box) එකතු කිරීම.   IV. කලාත්මක අකුරු (Word Art) එකතු කිරීම.

❖ පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 8, 9, 10 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

	A	B	C	D
1				
2				

08. ඉහත වගුවේ A,B,C,D ලෙස නම් කර ඇත්තේ,

I. පේළි II. තීරු III. කෝෂ IV. කෝෂ පරාස

09. ඉහත වගුවේ 1,2 ලෙස නම් කර ඇත්තේ,

I. පේළි II. තීරු III. කෝෂ IV. කෝෂ පරාස

10. ඉහත වගුවේ ඇති කෝෂ ගණන වන්නේ,

I. 4 II. 2 III. 5 IV.8

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. වදන් සැකසුම් මෘදුකාංගය මගින් නිර්මාණය කළ හැකි ලේඛන වර්ග 04 ක් නම් කරන්න.

02. පහත වගුව සම්පූර්ණ කරන්න.

මෙවලම	කාර්යය
Open	
Save	
Print	

03. අයිතමයට ගැළපෙන ක්‍රියාකාරකම යා කරන්න.



අකුරු වර්ග වෙනස් කිරීම. (Font Face)



පේළියේ පහළට ගැනීම. (Subscript)



අකුරු තද පැහැ ගැන්වීම. (Bold)



අකුරුවල ප්‍රමාණය වෙනස් කිරීමට (Size)

04. පහත වගුවේ ඇති තීරු, පේළි සහ කෝෂ ගණන කීයද?

- තීරු
- පේළි
- කෝෂ

05. වදන් සැකසුම් ලේඛනයක එකෙල්ල කිරීමේ සහ ස්ථාන ගත කිරීමේ මෙවලම් 03 ක් ලියන්න.

ඇල්ගොරිතම සහ ගැලීම් සටහන් - 8 ශ්‍රේණිය

සැකසුම - බී.එම්.ජී. අයේෂිකා කුමුදුමාලි   පාසල - අම්/ උහන මහා විද්‍යාලය (ජාතික පාසල)

- පෙළ පොතේ හතරවන ඒකකය ආශ්‍රයෙන් මේ සඳහා පිළිතුරු සපයන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. ගැටළු විසඳීමේදී ගැටළුව විශ්ලේෂණය කළ යුතුය. එහිදී හඳුනාගත යුතු අංගයක් ලෙස සැලකිය නොහැක්කේ,
1. ආදානය (Input)
2. ප්‍රතිදානය (Output)
3. ක්‍රියාවලිය (Process)
4. ව්‍යුහය (Structure)

2. සංඛ්‍යා දෙකක එකතුව සෙවීමට අදාළ ගැටළුවෙහි ආදානය වන්නේ,
1. සංඛ්‍යා දෙකෙහි එකතුව
2. පළමු සංඛ්‍යාව
3. පළමු සංඛ්‍යාව, දෙවන සංඛ්‍යාව
4. පළමු සංඛ්‍යාව + දෙවන සංඛ්‍යාව

3. ගැටළුවකට අදාළ ප්‍රතිඵල හඳුන්වනු ලබන්නේ,
1. ආදානය
2. ප්‍රතිදානය
3. ක්‍රමය
4. විස්ලේශනය

4. සිසුවෙකු I ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අඛණ්ඩව අධ්‍යාපනය ලබයි. එය අයත් වන පාලන ව්‍යුහය කුමක්ද?
1. තේරීම් (Selection)
2. පුනර්කරණ (Repetitions)
3. සරල තේරීම (Simple Selection)
4. අනුක්‍රමය (Sequence)

5. මෙම ගැලීම් සටහන් සංකේතය භාවිතා කරනු ලබන්නේ කුමක් දැක්වීම සඳහා ද?
1. ආරම්භය / අවසානය
2. ආදානය / ප්‍රතිදානය
3. ක්‍රියාවලිය
4. වරණය

6. පහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න.
a. Scratch යනු විවෘත ප්‍රභව මෘදුකාංගයකි.
b. මෙමගින් සජීවීකරණ හා ක්‍රීඩා නිර්මාණය කළ හැකිය.
c. මෙමගින් ඡායාරූප සංස්කරණය කිරීම කළ හැකිය.

1. a පමණි   2. a, b පමණි   3. b, c පමණි   4. a ,b,c සියල්ලම

7. ජංගම හා සුහුරු උපාංගයන් අන්තර්ගත නොවන පිළිතුර වන්නේ කුමක්ද?
1. ටැබ්ලට් (Tablet)
2. සුහුරු දුරකතනය (Smart Phone)
3. සුහුරු රූපවාහිනිය(Smart TV)
4. තාපන දඟරය (Heater)

8. වර්තමානයේ සුහුරු උපාංග (Smart Device) ප්‍රචලිතව පවතින අතර මේවා අතරින් ගුවන් ගත කර ඡායාරූප ලබාගැනීමට භාවිතා කරනු ලබන සුහුරු උපාංගය වන්නේ ,
1. සුහුරු දුරකතනය (Smart Phone)
2. සුහුරු කන්ණාඩිය (Smart Spectacle)
3. ඩ්‍රෝන කැමරා (Drone Camera)
4. සුහුරු රූපවාහිනී යන්ත්‍රය(Smart TV)

9. එක් භාෂාවකින් දක්වන පාඨ වෙනත් භාෂාවකට පරිවර්තනය කර ගැනීමට භාවිතා කරනු ලබන යෙදුම් මෘදුකාංගය වන්නේ මින් කවරක්ද?
1. ශබ්දකෝෂය (Dictionary)
2. මාලිමාව (Compass)
3. QR කේත කියවනය (QR code Reader)
4. භාෂා පරිවර්තකය (Translator)

10. 21 MOD 5 හි අගය වන්නේ කුමක්ද?

1. 0   2. 1   3. 4   4. 5

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01.

i) ඇල්ගොරිතමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.

ii) සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සෙවීම ට අදාළ ආදානය, ප්‍රතිදානය හා ක්‍රියාවලිය ලියා දක්වන්න.

iii) සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සෙවීම සඳහා ඇල්ගොරිතමය ගැලීම් සටහන් මගින් දක්වන්න.

02.

i) ඇල්ගොරිතම නිරුපණය කිරීමට අදාළ පාලන ව්‍යුහ තුනකි. ඒවා ලියා දක්වන්න.

ii) අනුක්‍රමයට අදාළ ගැටලු තුනක් ලියන්න.

iii) පොතක මිල ලබා දුන් විට පොත් 10 ක මිල සෙවීමට අදාළ ගැලීම් සටහන අඳින්න.

03.

i) තේරීම් පාලන ව්‍යුහයට අදාළ සංකේතය ඇඳ දක්වන්න.

ii) තේරීමට අදාළ ගැටලු තුනක් ලියන්න.

iii) ගණිතය විෂය සඳහා ලකුණු 35 හෝ 35ට වැඩි නම් සමත් ලෙසද, 35 ට අඩු නම් අසමත් ලෙසද ප්‍රදර්ශනය කිරීමට අදාළ ගැලීම් සටහන අඳින්න.

04. පහත සඳහන් උපදෙස් කාණ්ඩ ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන පිළිතුර සත්‍ය / අසත්‍ය බව දක්වන්න.

i



ii



ii



iv



v





vi

05. පහත සඳහන් වන්නේ වයස 18 ට වැඩි නම් වැඩිහිටියකු ලෙස ද අඩු නම් ළමයෙකු ලෙස ද ප්‍රදර්ශනය කිරීමට අදාළ වැඩසටහනේ Scratch ක්‍රමලේඛයට අදාල කාණ්ඩ (Block) කිහිපයකි ඒවා නිවැරදි අනුපිළිවෙලට පෙළගස්වන්න.

A



B



C



D



E

F



G



H



භෞතික ආගණනය සඳහා මෘදුකාංග භාවිතය - 8 ශ්‍රේණිය

සැකසුම - බී.එම්.ජී. අයේෂිකා කුමුදුමාලි

පාසල - අම්/ උහන මහා විද්‍යාලය (ජාතික පාසල)

• පෙළ පොතේ පස්වන ඒකකය ආශ්‍රයෙන් මේ සඳහා පිළිතුරු සපයන්න.

1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා ලබා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. මූලික තාර්කික ද්වාර සංඛ්‍යාව කොපමණද?

1. දෙකකි 2. තුනකි 3. හතරකි 4. පහකි

2.  මෙම සංකේතය ට අදාල තාර්කික ද්වාරය වන්නේ,

1. AND 2. OR 3. NOT 4. NOR

3. 

මෙහි F හි ප්‍රතිදානයට අදාල ප්‍රකාශය දැක්වෙන පිළිතුර වන්නේ

1. A.B 2. A+B 3. A.B 4. A+B

4. ආදානයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිදානය දක්වනු ලබන තාර්කික ද්වාරය කුමක්ද?

1. AND 2. OR 3. NOR 4. NOT

5. සංඛ්‍යාංක තාර්කික පරිපථයක ආදාන ප්‍රතිදාන දක්වනු ලබන ආකාරය වන්නේ ?

1. දශමය 2. ද්විමය 3. අෂ්ඨමය 4. ෂඩ් දශමය

6. ආදාන දෙකක් සහිත AND ද්වාරයක ප්‍රතිදානය 1 වීමට නම් එහි ආදාන වලට තිබිය යුතු අගයන් වන්නේ

1. 0,0 2. 0,1 3. 1,0 4. 1,1

7. අංකිත සංඥා දැක්වෙන රූප සටහන වන්නේ මින් කුමක්ද?

1. 
2.
3. 
4. 

8. පහත ප්‍රකාශ සලකන්න.,

a. CPU ආදී මූලික බොහෝ අංගවල ගොඩනැගීම් ඒකකය තාර්කික ද්වාරය යි.
b. ද්විමය අගය දැක්වීම true / false ලෙස ද යෙදිය හැක.
c. දත්ත සැකසීමේ දී සැකසීමේදී and තාර්කික ද්වාරය පමණක් භාවිතා කරයි.

මේවා අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ

1. a හා b පමණි
2. b හා c පමණි
3. a හා c පමණි
4. a,b හා c සියල්ල

9. තාර්කික ද්වාරවල ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීමට භාවිතා වන යෙදුම් මෘදුකාංගය වන්නේ මින් කවරක්ද?

1. Microsoft Word
2. Microsoft Logic
3. Multimedia Logic
4. Apple Keynote

10. OR ද්වාරය මගින් ලබාදෙන ප්‍රතිදානයන් (F) දැක්වෙන සත්‍යතා වගුව වන්නේ මින් කුමක්ද?

1.

A	B	F
0	0	1
0	1	0
1	0	0
1	1	1

2.

A	B	F
0	0	1
0	1	1
1	0	1
1	1	0

3.

A	B	F
0	0	0
0	1	1
1	0	1
1	1	1

4.

A	B	F
0	0	0
0	1	0
1	0	0
1	1	1

- පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01.

i) මූලික තාර්කික ද්වාර නම් කරන්න.
ii) එම තාර්කික ද්වාර වලට අදාළ සංකේත ඇඳ දක්වන්න.
iii) NOT ද්වාරයට අදාළ සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

02.

i) AND ද්වාරයේ ආදානයන් A හා B ලෙස සලකා ප්‍රතිදානයට අදාළ ප්‍රකාශනය ලියන්න.
ii) එම ද්වාරයට අදාල සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

03.

i) OR ද්වාරයේ ආදානයන් X හා Y ලෙස සලකා ප්‍රතිදානයට අදාළ ප්‍රකාශනය ලියන්න.
ii) එම ද්වාරයට අදාල සත්‍යතා වගුව ඇඳ දක්වන්න.

04. පහත සඳහන් පරිපථ වලට අදාල ප්‍රතිදානයන් ලියා දක්වන්න.

i



ii



iii



iv



05. පහත දැක්වෙන්නේ MultiMedia Logic මෘදුකාංගය භාවිතයෙන් සැකසූ තාර්කික පරිපථයක් වේ. පහත එක් එක් අවස්ථා වලදී LED බල්බය දැල්වේද නොදැල්වේද යන්න සඳහන් කරන්න.



i) A ස්විචය පමණක් On අවස්ථාවේ පවතින විට
ii) B ස්විචය පමණක් On අවස්ථාවේ පවතින විට
iii) C ස්විචය පමණක් On අවස්ථාවේ පවතින විට
iv) D ස්විචය පමණක් On අවස්ථාවේ පවතින විට

අන්තර්ජාලයේ සැරිසරමු. - 8 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය , අම්පාර

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. අන්තර්ජාල සේවා සපයන ආයතනය .... නමින් හඳුන්වයි.

I. Http II. WWW III. ISP IV. Web Browser

02. පහත දැ අතරින් වෙබ් අතිරික්සුවක් (Web Browser) නොවන්නේ,

I. Opera II. Yahoo III. Fire Fox IV. Safari

03. අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය සඳහා .... යොදා ගනු ලබයි.

I. අධි සන්ධාන II. වෙබ් පිටු III. වෙබ් අතිරික්සු IV. සෙවුම් යන්ත්‍ර

04. වෙබ් පිටු අතර ගමන් කිරීම සඳහා යොදා ගනී.

I. අධි සන්ධාන II. වෙබ් පිටු III. වෙබ් අතිරික්සු IV. සෙවුම් යන්ත්‍ර

05. වෙබ් පිටු නිර්මාණය සඳහා භාවිතා කරනු ලබන වැඩතලය .... ලෙස හඳුන්වයි.

I. මෘදුකාංගය II. උසුලන III. ව්‍යුහය IV. මෙවලම

06. උසුගනයක් සඳහා යොදා ගනු ලබන සලකුණ වන්නේ,

I. < > II. ( ) III. { } IV. [ ]

07. HTML යනු ,

I. Hyper Text Markup Language II. Higher Text Markup Language

III. Hyper Training Mark Language IV. Higher Training Mark Language

08. ඡේදයක් ආරම්භ කිරීම සඳහා යොදා ගනු ලබන HTML උසුලනය වන්නේ,

I. II. <i> III. <p> IV.

09. <img src….>උසුලනය මඟින් කරනු ලබන කාර්යය වන්නේ,

I. අධි සන්ධානයක් (Hyperlink) ඇති කිරීම.
II. පිටුවෙන් තිරස් ව මධ්‍යනය කිරීම.
III. වෙබ් පිටු නාමය යෙදීම සඳහා සීමාව.
IV. පින්තූරයක් ඇතුළත් කිරීම.

10. School යන වචනය තද පැහැ ගන්වා ගැනීමට නිවැරදි ව භාවිතා කළ යුතු උසුලනය වන්නේ,

I. School
II. School<\b>
III. School
IV. School

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. අන්තර්ජාලය යන්න හඳුන්වන්න.

02. ප්‍රධාන සෙවුම් යන්ත්‍ර 04 ක් ලියන්න.

03. වෙබ් පිටු නිර්මාණයට පෙර සැලකිළිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න.

04. වෙබ් පිටු නිර්මාණය සඳහා අවශ්‍ය වන ප්‍රධාන අංග මොනවාද ?

05. පහත වගුව පුරවන්න.

HTML උසුලන	*කාර්යය*
<body>	
<h>	
<b>	